# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2493/20 - 2026 ජූනි මස 17 වැනි බදාදා - 2026.06.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : ඇ ප්‍රා ලේ/5/8/30.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 03/J/92/E/126.

කෙහෙල්ඕවිටිගම විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළේ පල්ලෙ පත්තුවේ, කෙහෙල්ඕවිටිගම ග්‍රාම නිලධාරී වසමේ (අංක 188ඒ) කෙහෙල්ඕවිටිගම පිහිටි අ.ග.පි. 59, අතිරේක අංකය 16, පත්‍ර අංකය 22 දරන සැළැස්මේ සඳහන් ඉඩමේ කැබලි අංක 3 ක් වේ:

01. කැබලි අංක **629**

ඉඩමේ නම : කපාලුකන්දෙහේන; හිමිකම් කියන්නා : රජය (38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ රජයට භුක්තිය භාරගෙන ඇත); මුල් හිමිකම් පාන්නා: කෙහෙල්ඕවිටිගම, උඩ නිරිඇල්ල පදිංචි අමරසිංහ ආරච්චිලාගේ ධනසේකර නැමති අය; ප්‍රමාණය: හෙක්. 0.0326.

*මායිම්* :

*උතුරට* : කැබලි අංක 2BB; *නැගෙනහිරට* : කැබලි අංක 2BB සහ 2O; *දකුණට* : කැබලි අංක 630; *බටහිරට* : කැබලි අංක 630 සහ 2BB.

02. කැබලි අංක **630**

ඉඩමේ නම : හොරනැමුල්ල කුඹුර *නොහොත්* හොරපදාළුව කුඹුර; හිමිකම් කියන්නා : රජය (38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ රජයට භුක්තිය භාරගෙන ඇත); මුල් හිමිකම් පාන්නෝ: අංක 37, අභය මාවත, බොරුපන පාර, රත්මලාන පදිංචි ආර්. ඇම්. විජේසේන රාජපක්ෂ, කෙහෙල්ඕවිටිගම, උඩ නිරිඇල්ල පදිංචි ඇම්. ඒ. ධර්මසේන, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. හීන්නිලමේ, කෙහෙල්ඕවිටිගම උඩනිරිඇල්ල පදිංචි ඩී. ඒ. ගාමිණී වේරගම, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි ඒ. ඒ. ධනසේකර, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එස්. නොරගල්ල, කෙහෙල්ඕවිටිගම, උඩ නිරිඇල්ල පදිංචි ඩබ්. ඒ. ජයසේන, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. ගුණතිලක, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. ලොකුමහත්තයා, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. ජෝතිරත්න, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. මද්දුම මහත්තයා, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. කරුණාරත්න, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. ඩිංගිරිමහත්තයා, කෙහෙල්ඕවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. ජෝතිපාල යන අයයි; ප්‍රමාණය: හෙක්. 0.4874.

*මායිම්* :

*උතුරට* : කැබලි අංක 631, 2BB, 629, 2O, 37 සහ 151; *නැගෙනහිරට* : කැබලි අංක 2BB, 2O, 151 සහ 37; *දකුණට* : කැබලි අංක 37 සහ බාදුරා ඇළ; *බටහිරට* : බාදුරා ඇළ, කැබලි අංක 631 සහ 2BB.


1A - G 047054 - 23 (2026/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. කැබලි අංක **631**

ඉඩමේ නම : කපාලුකන්දෙහේන, ගොමගස්ගොඩැල්ලහේන; හිමිකම් කියන්නා : රජය (38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ රජයට භුක්තිය භාරගෙන ඇත); මුල් හිමිකම් පාන්නා: කෙහෙල්ඔවිටිගම, උඩනිරිඇල්ල පදිංචි එන්. කරුණාරත්න නැමති අය; ප්‍රමාණය: හෙක්. 0.0060.

*මායිම්* :

*උතුරට* : කැබලි අංක $2^{BK5}$ සහ $2^{BB}$; *නැගෙනහිරට* : කැබලි අංක 630; *දකුණට* : කැබලි අංක 630 සහ බාදුරා ඇල; *බටහිරට* : කැබලි අංක $2^{BK5}$ සහ $2^{BB}$.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2026 අගෝස්තු මස 24** වැනි දින **පෙ. ව. 10.00** ට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026 අගෝස්තු මස 17 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් සනාථ කිරීම සඳහා ලිපිලේඛන එදිනට මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

**එච්. එම්. හේමන්ත බණ්ඩාර,**
ප්‍රාදේශීය ලේකම්,
ඇලපාත.

2026 ජුනි මස 15 වැනි දින,
ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0203

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය* : 4/3/5/2014/HW/39.
*රත්නපුර ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : RPDS/ LND/09/ACQ/11/RDA/71.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තිය යටතේ අංක 1909/40 - 2015.04.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට්* පත්‍රයේ III වැනි කොටස ඉඩම් හි, 4A පිටුවේ කැබලි අංක 73 හි ඉඩමේ නම : මනන්නලාගේ කනත්ත; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: පියදාස කහඳගම, බටුගෙදර රත්නපුර; ප්‍රමාණය: හෙක් 0.4951 ක් ලෙස දක්වා ඇත.

එය රත්නපුර ජොෂ්ඨ මිනුම් අධිකාරිගේ R/RTN/2015/616, 2015.11.24 අනුරේඛනයේ කැබලි අක්ෂර A හි ඉඩමේ නම : මනන්නලාගේ කනත්ත; වර්තමාන ඉඩම් පරිහරණය : කුඹුර; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා : බටුගෙදර, රත්නපුර පදිංචි පියදාස කහඳගම; ප්‍රමාණය: හෙක් 0.4783 ක් ලෙසත් එම අනුරේඛනයේ කැබලි අක්ෂර B, ඉඩමේ නම : මනන්නලාගේ කනත්ත; වර්තමාන ඉඩම් පරිහරණය : වත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා : 30/39, සේනානායක මාවත, රත්නපුර පදිංචි එම්.එස්. සී. ප්‍රනාන්දු; ප්‍රමාණය: හෙක් 0.0168 ක් ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**චින්තන උදාර නානායක්කාර,**
ප්‍රාදේශීය ලේකම්,
රත්නපුර.

2026 ජුනි මස 09 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0202

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.